# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ තොරතුරු සේවාව

ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට/නිෂ්පාදකයින්ට, විදේශීය ගැනුම්කරුවන්ට සහ මහජනතාවට අන්තර් ජාතික වෙළඳාම පිළිබඳව තොරතුරු බෙදා හැරීමේ කාර්යය, වෙළඳ තොරතුරු සේවා අංශයට පැවරී ඇත. අපනයන සහ ආනයන වෙළඳාම පිළිබඳව සංඛ්‍යාලේඛන, අන්තර් ජාතික මිල ගණන්, විදේශීය ගැනුම්කරුවන්, අපනයන ක්‍රියාවලිය ආදිය පිළිබඳව ආනයනකරුවන්ට, නිෂ්පාදකයින්ට, අපනයන නැඹුරුවක් ඇති නිෂ්පාදකයින්ට සහ මහජනතාවට තොරතුරු ලබාදීමෙන් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට මෙම අංශය මහින් නොකඩවා කටයුතු කෙරේ.

අපනයනකරුවන්ගේ/නිෂ්පාදකයින්ගේ සහ අපනයනය ක්ෂේත්‍රයට සම්බන්ධවීමට උනන්දුවක් දක්වන පිරිස්වලට අවශ්‍ය භාණ්ඩ සහ වෙළඳපොළ පිළිබඳවූ විවිධ තොරතුරු ලබා දීමට හැකිවන පරිදි පරිගණකගත කරන ලද තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යෑමද මෙම අංශයේ වගකීමකි. තවද, අවශ්‍ය තොරතුරු ඉතා ඉක්මණින් සහ විවිධ අංශවලින් ලබා දීමට හැකිවන පරිදි කටයුතු සකස්කර ඇත. ජාතික මෙන්ම අන්තර් ජාතික පරිගණකගත දත්ත පද්ධතිවලට ප්‍රවේශවීමටද ඉඩප්‍රස්ථා සැලසීම මෙම අංශයේ කාර්යයක්වේ.

වෙළඳ තොරතුරු සේවා අංශය මහින් සපයනු ලබන බහුවිධ සේවාවන් අතර පුස්තකාල සේවයක් පවත්වාගෙන යාම, උපදේශාත්මක සේවාවක් පවත්වාගෙන යාම, ආපනයනකරුවන්ට විශේෂිතවූ සඟරා " Expo News " සහ " අපනයන පුවත් "පළ කිරීම, විදෙස් ගැණුම්කරුවන්ට විශේෂවූ "Business Lanka" සඟරාව පළ කිරීම, විවිධ පාර්ශවයන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම වැදගත් ස්ථානයක් ගනී.

අපනයන සංවර්ධන මණ්ඩලය මහින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව නිල ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම, නිල වාර්තා සකස්කර නිකුත් කිරීම සහ මාධ්‍ය කටයුතු ආවරණය කිරීමද මෙම අංශය මහින් සිදු කරනු ලබයි. තවද අපනයන භාණ්ඩ සහ අපනයන වෙළඳපොළ පිළිබඳව වාර්තාමය විඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කර විදේශීය රටවල බෙදා හැරීමද සිදු කෙරේ.

වාර්ෂිකව අපනයනකරුවන්ගේ/සැපයුම්කරුවන්ගේ නාමාවලියක් ඉදිරිපත් කිරීමද මෙම අංශය මහින් සිදු කරනු ලබන නවත් වැදගත් කාර්යයකි.

**අවශ්‍ය තොරතුරු**

ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට, නිෂ්පාදකයින්ට අපනයන ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ඨවීමට කැමති අයවලුන්ට අපනයන ක්‍රියාවලියේදී අවශ්‍යවන තොරතුරු විදේශීය ගැනුම්කරුවන්, අලෙවිය, මිල ගණන්, විදෙස් වෙළඳපොළට පිවිසීම ආදිය පිළිබඳ තොරතුරු ලබා දීම සහ ඒ සඳහා උපයෝගී කරගන්නා මූලාශ්‍ර පහත දැක්වේ.

වෙළඳපොළ පිළිබඳවූ තොරතුරු පහත දැක්වේ.

**අපනයනය කිරීම සඳහා ව්‍යාපාරික සහකරුවකු සොයා ගැනීම**

- ❑ විදේශීය ගැනුම්කරුවෝ
- ❑ දේශීය සැපයුම්කරුවෝ
- ❑ විදේශීය ගැනුම්කරුවන් ලබාදීමේදී, පහත දැක්වෙන තොරතුරු මූලාශ්‍ර උපයෝගී කරගනු ලැබේ.
- ❑ විදේශීය ගැනුම්කරුවන්ගෙන් කෙලින්ම ලැබෙන විමසුම් ලිපි
- ❑ විදේශීය තානාපති සේවාවලින් ලැබෙන විමසුම් ලිපි
- ❑ වානිජ දෙපාර්තමේන්තුවෙන් ලැබෙන විමසුම් ලිපි
- ❑ ගැනුම්කරුවන් පිළිබඳවූ අන්තර් ජාතික දත්ත පද්ධති
- ❑ විදේශීය රටවලින් ප්‍රකාශිත ගැනුම්කරුවන් පිළිබඳ වූ වෙළඳ නාමාවලිය
- ❑ ගැනුම්කරුවන් පිළිබඳවූ විශේෂිත ප්‍රකාශන
- ❑ අපනයන සංවර්ධන මණ්ඩලය මහින් පරිගණක ගත කරන ලද දත්ත

දේශීය සැපයුම්කරුවන් පිළිබඳ විස්තර ලබා දීමේදී පහත දැක්වෙන මූලාශ්‍ර උපයෝගී කරගනු ලැබේ

- ❑ අපනයන සංවර්ධන මණ්ඩලය මහින් සම්පාදිත අපනයනකරුවන්ගේ/සැපයුම්කරුවන්ගේ නාමාවලිය

**භාණ්ඩ අලෙවිය පිළිබඳ තොරතුරු**

- ❑ ඉල්ලුම සහ සැපයුම පිළිබඳ තොරතුරු
- ❑ විදේශීය සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු
- ❑ තරඟකරුවන් පිළිබඳ තොරතුරු
- ❑ මෝස්තර/නිර්මාණ පිළිබඳ තොරතුරු
- ❑ පරිභෝජනය සහ පාරිභෝගිකයන් පිළිබඳ තොරතුරු
- ❑ භාණ්ඩ බෙදා හැරීම පිළිබඳ තොරතුරු

මෙම තොරතුරු ලබා දීමේදී පහත දැක්වෙන මූලාශ්‍ර උපයෝගී කරගනු ලැබේ.

- ❑ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ තොරතුරු සේවා අංශය මහින් පවත්වාගෙන යනු ලබන පුස්තකාලයෙහි ඇති විදේශීය රටවල සහ භාණ්ඩ පිළිබඳ විශේෂිත මුද්‍රිත ප්‍රකාශන

- විදේශීය රටවල ඇති අපනයනය/ආනයන ප්‍රවර්ධන ආයතන සහ අන්තර් ජාතික වෙළඳ ප්‍රවර්ධන ආයතන මගින් ප්‍රකාශිත භාණ්ඩ සහ වෙළඳපොළ පිළිබඳවූ මුද්‍රිත ප්‍රකාශන

**අන්තර් ජාතික මිල ගණන් පිළිබඳ තොරතුරු**

- මෙම මිල ගණන් නැවතෙක් වියදම් සහිත (F.O.E) සහ වියදම් සහ නැව් ගාස්තු සහිත ( C.F.R.) සහ වියදම්, රක්ෂණ හා නැව් ගාස්තු සහිත (C.I.F) යන ත්‍රිවිධ ආකාරයෙන් ලබාගත හැකිය.

මෙම තොරතුරු ලබාදීමේදී පහත දැක්වෙන මූලාශ්‍ර උපයෝගී කරගනු ලැබේ.

- කෘෂි ද්‍රව්‍ය සඳහාවූ අයි.ටී.සී./එම්. එන්.එස් මිල ගණන් පිළිබඳ විස්තර
- මුද්‍රිත ප්‍රකාශණ
  - පබ්ලික් ලෙජර්
  - ඉන්ෆෝෆිෂ් ප්‍රකාශන (INFOFISH)
  - වෙනත් සඟරා/ප්‍රකාශන
- නිෂ්පාදන භාණ්ඩ සඳහා විවිධ මුද්‍රිත ප්‍රකාශන
- විවිධ ප්‍රකාශන

**අන්තර් ජාතික වෙළඳපොළට පිවිසීම පිළිබඳ තොරතුරු**

- තීරු බදු
- තීරු බදු නොවන බාධක ( පංගු - Quotas ) බලපත්‍ර ( Licensing )
- තාක්ෂණික ප්‍රමිති සහතික
- තත්ත්ව පාලන සහතික
- සෞඛ්‍ය සහතික
- සනීපාරක්ෂක සහතික
- ඇසුරුම් සහ ලේබල් පිළිබඳ අවශ්‍යතා
- දියුණුවන රටවලට ලබාදී ඇති තීරුබදු සහන

මෙම තොරතුරු සැපයීමේදී පහත දැක්වෙන මූලාශ්‍ර උපයෝගී කරගනු ලැබෙයි

- අන්තර් ජාතික රේගු ප්‍රකාශනය ( The International Customs Journal)
- ඒ ඒ රටවලින් ප්‍රකාශිත විදේශ වෙළඳාම් මතවූ තීරුබදු සහ අනෙකුත් බදු පිළිබඳ විස්තර
- වෙළඳ වරණයන් පිළිබඳව පොදුක්‍රමය යටතේ ඇතුළත්වූ සංවර්ධනයවූ රටවල ප්‍රකාශන
- බදු සහන ( G.S.P )
- වෙළඳාම ලිහිල්කරණය යටතේ " සැප්තා" ගිවිසුමෙන් ලැබෙන බදු සහන
- බහු වාර්ගික වෙළඳ ක්‍රම යටතේ ලැබෙන බදු සහන
- ඉන්දු ලංකා වෙළඳ ගිවිසුම යටතේ ලැබෙන බදු සහන (ISLFTA)

**භාණ්ඩ තත්ත්වය පිළිබඳ තොරතුරු**

- භාණ්ඩ පිරිවිතර
- ප්‍රමිතීන්

මෙම තොරතුරු සැපයීමට පහත දැක්වෙන මූලාශ්‍ර උපයෝගී කරගනු ලැබේ.

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ප්‍රකාශිත භාණ්ඩ පිළිබඳ ප්‍රමිතීන්
- අන්තර් ජාතික ප්‍රමිති ආයතනය මගින් ප්‍රකාශිත ප්‍රමිතීන් ( ISO )
- වෙනත් රටවලින් ප්‍රකාශිත භාණ්ඩ සහ සේවා පිළිබඳ ප්‍රමිතීන්

**ඇසුරුම් පිළිබඳ තොරතුරු**

අපනයනය සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීමේදී ඇසුරුම් සහ ලේබල පිළිබඳව අපනයනකරුවන් දැනුවත්වීම සහ ඒ ඒ රටවල පාරිභෝගික අවශ්‍යතා අනුව ඉදිරිපත් කිරීම ඉතාම වැදගත්වේ. එබැවින් ඇසුරුම් පිළිබඳව තොරතුරු අපනයනකරුවන්ට/නිෂ්පාදකයින්ට ලබා දීමේදී පහත දැක්වෙන මූලාශ්‍ර උපයෝගී කරගනු ලැබේ.

- ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය
- අන්තර් ජාතික වෙළඳ ආයතනය මගින් සම්පාදිත ප්‍රකාශන සහ අධ්‍යයනයන්
- සංවර්ධනයවූ රටවලින් ප්‍රකාශිත අධ්‍යයනයන්
- ඇසුරුම් පිළිබඳවූ විශේෂිත ප්‍රකාශන සහ සඟරා

**අපනයනයට ප්‍රවිෂ්ඨවීමේදී අවශ්‍ය තොරතුරු**

- අපනයනය ක්‍රියා පටිපාටිය සහ භාණ්ඩ අපනයනය කිරීමේ ක්‍රියාවලිය

  මේ පිළිබඳ තොරතුරු සැපයීම සඳහා වෙළඳ තොරතුරු අංශය උපදේශක සේවාවක් පවත්වාගෙන යනු ලබයි. මීට අමතරව ඒ ඒ භාණ්ඩ සඳහාවූ අපනයන ක්‍රියාවලිය පිළිබඳ විස්තර අඩංගු ප්‍රකාශන මගින්ද තොරතුරු ලබා දේ.

**සංඛ්‍යාලේඛන**

- අපනයන සංඛ්‍යාලේඛන
- ආනයන සංඛ්‍යාලේඛන
- සැපයුම්කරුවන්/අපනයනකරුවන් පිළිබඳවූ ලේඛන

මෙම තොරතුරු සැපයීම සඳහා පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. මෙම තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර වනුයේ,

- ශ්‍රී ලංකා රේගු අධිකාරිය
- අන්තර් ජාතික වෙළඳ ආයතනය (I.T.C ) මගින් නිකුත්කර ඇති පරිගණකගත කරන ලද සංඛ්‍යාලේඛන
- විදේශීය වෙළඳ ප්‍රවර්ධනය සඳහාවූ ආයතනය මගින් නිකුත්කර ඇති ප්‍රකාශන සහ අධ්‍යයනයන්

## පුස්තකාල සේවාව

අපනයනකරුවන්ට/නිෂ්පාදකයින්/අපනයනය පිළිබඳ උනන්දුවක් දක්වන අයට/මහජනතාවට මෙන්ම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන්ට අවශ්‍ය මුද්‍රිත තොරතුරු ලබාදීමේ අරමුණින් පුස්තකාල සේවාවක් පවත්වා ගෙනයනු ලබයි. පුස්තකාලයේ විවිධ භාණ්ඩ පිළිබඳව, ඒ ඒ රටවල වෙළඳපොළ පිළිබඳවූ මුද්‍රිත ප්‍රකාශන/පොත් /සඟරා ඇති අතර, විවිධ රටවල අපනයනය/ආනයනය සංඛ්‍යාලේඛන සඳහාවූ ප්‍රකාශන ඇත.

අපනයන භාණ්ඩ සහ සේවාවන් සඳහා විදේශීය වෙළඳපොළෙහි අලෙවි අවස්ථාවන් උදාකර ගැනීම

අපනයන භාණ්ඩ සහ සේවාවන් පිළිබඳව තොරතුරු ලබාදීම සඳහා පහත දැක්වෙන තොරතුරු මූලාශ්‍ර උපයෝගී කරගනු ලැබේ.

- අපනයන භාණ්ඩ සහ සේවාවන් පිළිබඳව මුද්‍රිත ප්‍රකාශන
- අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ප්‍රකාශිත අපනයන ප්‍රගති දර්ශකයන් (Export Perfomance Indicators)
- වෙනත් ආයතන මගින් ප්‍රකාශිත දත්තයන්

විදේශීය වෙළඳපොළෙහි ඇති අලෙවි අවස්ථාවන් පිළිබඳව තොරතුරු ලබා දීමේදී පහත දැක්වෙන මූලාශ්‍ර උපයෝගී කරගනු ලැබේ.

- අන්තර් ජාතික වෙළඳ ආයතනයේ අලෙවි පර්යේෂණ ප්‍රකාශන
- සංවර්ධනය වූ රටවල පිහිටා ඇති විදේශීය වෙළඳාම ප්‍රවර්ධනය සඳහා වූ ආයතන මගින් ප්‍රකාශිත අලෙවි පර්යේෂණ වාර්තා, භාණ්ඩ සහ අලෙවිය පිළිබඳවූ සමීක්ෂණ වාර්තා
- අපනයන භාණ්ඩ සහ සේවා සඳහා පිහිටුවා ඇති අන්තර් ජාතික ආයතන මගින් ප්‍රකාශිත සමීක්ෂණ වාර්තා සහ පර්යේෂණ වාර්තා සහ වාර සඟරා
- වෙනත් විදේශීය වෙළඳපොළ සහ භාණ්ඩ පිළිබඳ වූ සමීක්ෂණ වාර්තා සහ පර්යේෂණ වාර්තා

## තොරතුරු තාක්ෂණය

දියුණු තොරතුරු තාක්ෂණය උපයෝගී කරගනිමින් සහ නව මෘදුකාංග පද්ධතීන් ස්ථාපිත කරමින් අපනයනකරුවන්ට / නිෂ්පාදකයන්ට / විදේශීය ගැනුම්කරුවන්ට අවශ්‍ය තොරතුරු ලබා දෙමින් මෙම අංශය වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. අපනයනකරුවන් වෙත/මහජනතාව වෙත අදාළ තොරතුරු ලබාදීමේදී අවශ්‍යතාවය අනුව ශබ්දාකර ඇති දත්තයන් නැවත සකස් කරදීම (value added information ) මෙම අංශය මගින් කරනු ලබන වැදගත් කාර්ය භාරයකි.

විදේශීය ආයතනවලින් ලබා ගත් තොරතුරු (දත්තයන්) ඒ ඒ අයවලුන්ගේ අවශ්‍යතාවය අනුව නැවත සකස් කර දීම මෙම අංශය මගින් සිදු කරනු ලබන නවත් වැදගත් සේවාවකි. මේ සඳහා නව මෘදුකාංග පද්ධතිවල සහාය ලබා ගනී. ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් වෙත අන්තර් ජාතික මිල ගණන් විශේෂයෙන් කෘෂි ද්‍රව්‍යවල අන්තර් ජාතික මිල ගණන් ලබා දීමේදී නවීන තොරතුරු තාක්ෂණය උපයෝගී කරගැනීම, අපනයනකරුවන්ට/ නිෂ්පාදකයින්ට ඉටුවූ කරන වැදගත් සේවාවකි.

## උපදේශක සේවාව

අපනයනකරුවන්/නිෂ්පාදකයින්/අපනයන පිළිබඳව උනන්දුවක් දක්වන අය වෙත අදාළ තොරතුරු ලබා දීම සඳහා උපදේශක සේවාවක් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම උපදේශක සේවාව මගින්, අපනයන භාණ්ඩ, අපනයන වෙළඳපොළ, අලෙවිය, අපනයන ක්‍රියාපටිපාටිය ආදිය පිළිබඳ තොරතුරු සැපයේ.

## මුද්‍රිත ප්‍රකාශන

අපනයනකරුවන්ගේ/නිෂ්පාදකයින්ගේ සහ මහජනතාවගේ අවශ්‍යතාවය සපුරාලමින් සෑම මසකම ප්‍රවෘත්ති සහ විශේෂාංග සඟරාව වූ "EXPO NEWS" සහ " අපනයන පුවත්" පළ කිරීම වසර පුරාම සිදු කරනු ලබයි. විදේශ වෙළඳපොළ විමර්ශ ණ, භාණ්ඩ/ අලෙවිය සම්බන්ධ වාර්තා, කෘෂි ද්‍රව්‍ය සඳහාවූ අන්තර්ජාතික මිල ගණන් හා වෙනත් දත්ත ඇතුළත් මෙම සඟරා ඉංග්‍රීසි මාධ්‍යයෙන් මසකට දෙවරක් නිකුත් කරනු ලබන අතර, සිංහල මාධ්‍යයෙන් මසකට එක් වරක් නිකුත් කරනු ලබයි. විදේශීය ගැනුම්කරුවන්ට/විදේශීය ආනයනකරුවන්ට ශ්‍රී ලංකාවේ අපනයන සහ අපනයන භාණ්ඩ පිළිබඳව තොරතුරු ලබා දීමේ අරමුණින් වාර සඟරාවක් නිකුත් කරනු ලබයි. "Business Lanka" නම් වූ එම වාර සඟරාව ත්‍රෛමාසිකව නිකුත් කරනු ලබයි.

## ප්‍රවෘත්ති සහ වාර්තාමය වැඩසටහන්

වෙළඳ තොරතුරු සැපයීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම උපයෝගී කර ගැනීම සහ වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබන නවත් වැදගත් කාර්ය භාරයක්වේ. මීට අමතර අපනයන සංවර්ධන මණ්ඩල වෙනුවෙන් නිල ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම සහ අපනයන සංවර්ධන වැඩසටහන් පිළිබඳව වාර්තාමය ප්‍රවෘත්ති පළකිරීම, ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම ආදිය මෙම අංශය මගින් සිදුකරනු ලබයි.